**වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව - 2021**
**-----------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී සභාව සතු රු. 886,000 ක් වටිනා ඉඩම් 02 ක්, ප්‍රජා ශාලාව, රු. 6,665,000 ක් වටිනා සංවර්ධන වැඩ සහ උතුරු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු. 276,070 ක් වටිනා යන්ත්‍රෝපකරණ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් ජංගම් නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් අඩුවෙන් දැක්වුණි. | අදාල කටයුතු කෙරෙමින් පවති. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කාල පරිච්ඡේදයේ අදාල වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ නමට අයිතිය පවරා ගෙන නොමැති වාහන 4 ක වටිනාකම රු. 1,211,040 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | මේ සියළුම වාහන උතුරු නැගෙනහිර පළාත් සභාවෙන් ලබාදුන් ඒවාය. අදාල ලියවිලි නොමැතිවීමෙන් අයිතිය පවරා ගැනීමට නොහැකිව ඇත. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් රු. 10,587,137 ක් වටිනා ව්‍යාපෘති 04 ක් ඉටුකර නොතිබුණද, ඒවායේ ඇස්තමේන්තු සහ කොන්ත්‍රාත් වටිනාකමට ලේකම්ගේ නමින් වවුචර් පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ඉක්මවූ ආදායම් අඩුවෙන් ද ජංගම වගකීම් වැඩියෙන්ද දක්වා තිබුණි. | ඉහත රු. 10,587,137 ක් වටිනා ව්‍යාපෘති 04 ක වියදම් අදාල වර්ෂයේ වියදමට ඇතුලත් කිරීම සඳහා උපචිත පදනම අනුව ගෙවිය යුතු මුදලක් වශයෙන් 2021.12.31 දින වෙන්කර 2022 වර්ෂයේදි ගෙවීම් කරනු ලැබේ. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර සටහන් කළ බව සනාථ කළ යුතු අතර අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඈ) | සභාව සතු ඉඩම් 36 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් 36 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් මැනුම් කටයුතු නිමකර ඉඩම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | සභාව සතු ඉඩම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 81,666,815 | සනාථ කිරීමේ සාක්ෂි | 1993 වර්ෂයට පෙර අවසන් ගිණුම්වල දක්වා තිබුණු උක්ත වටිනාකමට අදාල ලිඛිත සාක්ෂි රටේ | සනාථ කරගැනීමට අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |

පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් ලියවිලි විනාශ වී ඇති බැවින් විස්තර ලබාගත නොහැකිව ඇත.

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.58,896,846 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,680,809 ක් විය.

**2.2** **ආදායම් පරිපාලන**

-------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| වරිපනම්<br>----------<br>සභාව සතු දේපළවලින් තෙල්ලිප්පලෙයි සහ මල්ලාහම් උප කාර්යාලවලට අයත් දේපළ තක්සේරු කිරීම 1963 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. තවද, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) අනුව සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි වලින් අයකර යුතු රු. 435,401 ක් වටිනා හිඟ වරිපනම් අයකිරීම් සඳහා පසුගිය වර්ෂ 03 ක කාලයක සිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | තෙල්ලිප්පලෙයි සහ මල්ලාහම් උප කාර්යාලවල වරිපනම් ඉකුත් වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර මෙම වර්ෂය සිට අළුත් තක්සේරු වටිනාකම අනුව වරිපනම් අයකරමින් පවති. කන්කසන්තුරෙයි සහ මයිලිට්ටි උප කාර්යාලවල තක්සේරු කටයුතු කෙරෙමින් පවති. හිඟ වරිපනම් අයකිරීම් සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති. | අදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් සංවර්ධන කටයුතු සඳහා වැය නොකර පොලී ආදායම් ඉපයීමේ අරමුණෙන් රු. 49,028,110 ක මුදලක් ස්ථාවර තැන්පත්වල තැන්පත් කර තිබූ බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අදාල කාර්මාන්තවල වැඩ නිමවන තෙක් අතිරේක ආදායම් උපයා ගැනීම සහ ආරක්ෂා හේතුන් මත මෙසේ ස්ථාවර තැන්පතුවල තැන්පත් කරනු ලැබේ. | සභා අරමුදල කාර්යක්ෂමතා සහ උපරිම ප්‍රයෝජනයට ගත හැකි කටයුතුවල යෙදවිය යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි 10 ක් සභාවේ නමට පවරාගෙන නොතිබුණි. | අදාල සුසානභූමිවල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත. | සුසානභූමිවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ඇප** | | |
| 2020 මාර්තු 07 දිනැති අංක PF/01/2017(අ) දරණ පළාත් මූල්‍ය චක්‍රලේඛය අනුව සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයකළයුතු රු. 90,000 ක සේවක ඇප තැන්පත් අයකර නොතිබුණි. | සේවක ඇප තැන්පත් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |